පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : නර්තනය

සතිය : 05

ශ්‍රේණිය : 6

සකස් කිරීම : සංජීවනී චන්ද්‍රසේන- මාවනැල්ල අධ්‍යාපන කලාපය

# ගුරු ගෙදර හා බැඳි සාරධර්ම සුරකිමු







වන ගතේ පිපි මල් දෙකක් මෙන්
මෙ අප ඇතිකළ මව් පියන්
විහාරෙට තැබූ රන් කොතක් මෙන්
ශිල්ප දුන් මගෙ ගුරු තුමන්

වටත් සිටිනා සියලු මහතුනි
දුටන් වරදක් සමාවන්
අදත් මෙම නෙර්තයට පළමුව
වදිමි මම මගේ ගුරු තුමන්

දුවේ පුතේ ඉහත දක්වා ඇත්තේ ගුරු වන්දනා කවියකි. මෙයින් ගුරුවරියට දක්වන භක්තිය හා ගෞරවය මනා ලෙස ඉස්මතු වේ.

අතීතයේදී අධ්‍යාපනය හැදෑරීමට ගුරුවරයාගේ නිවසෙහි නතරවී ගුරුවරයාගේ සියලු වැඩ කටයුතු වලට සහය වීමට ශිෂ්‍යයාට සිදුවිය. ඉන් ජීවන අත්දැකීම් රාශියක් ලබාගැනීමට හැකි විය.
උදා:- ගුරුවරයාගේ අණට කීකරු වීම

නර්තනය ඉගෙනීමට යන ශිෂ්‍යා ට ශාන්තිකර්ම සඳහා උදව් වෙමින් බෙර වාදනය සැරසිලි කැටයම් කැපීම වැනි කටයුතුවලට ප්‍රායෝගිකව සම්බන්ධ වීමට සිදුවේ.
ඒවා තුළින්

- තෙරුවන් නැමදීම
- ගුරුවරයාට නමස්කාර කිරීම
- වැඩිහිටියන්ට ගරු කිරීම
- සාමූහිකව වැඩ කිරීම වැනි ගුණාංග උගත හැකිවේ.

**ක්‍රියාකාරකම**

01. ඉහත ගුරු වන්දනා කවිය ගායනය කරන්න.
02. නර්තනය ඉගෙන ගන්නා පංති කාමරයේදී ඔබ අනුගමනය කරන වාරිත්‍ර විධි තුනක් ලියන්න.
03. ගුරු ගෙදර අධ්‍යාපනයෙන් ඔබ උගත් සාරධර්ම දෙකක් ලියන්න.